(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 18. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 පෙබරවාරි 07 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(මහාචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **එම්. කේ. එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු **එම්. එස්. උදුමාලෙබ්බේ මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **උපුල් කිත්සිරි මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **නීතිඥ සරත් කුමාර මහතා**

ගරු **නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **එම්. ඒ. සී. එස්. චතුරි ගංගානි මහත්මිය**

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු ටී. කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ජේ. එම්. තාහිර් මහතා

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු මොහමඩ් සාලි නලීම් මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු ඊ. එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු නයන වාසලතිලක මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්. ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

ගරු **නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

ගරු **මුහම්මද් ෆයිසාල් මහතා**

ගරු **රියාස් ෆාරුක් මහතා**

චමින්ද කුලරත්න මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් 2025 ජනවාරි 23 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව සහ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පරිසර අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) මාතලේ, කයිකාවල, මැදවේරගම, අංක 275 දරන ස්ථානයෙහි පදිංචි එච්. කේ. පී. සී. ජයසිංහ මහතාගෙන් ලැබුණු 2024.11.30 දිනැති පෙත්සම;

(ii) ගලේවෙල, වළකුඹුර, අංක 142, දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. සී. හර්ෂන් විජේරත්න මහතාගෙන් ලැබුණු 2024.11.22 දිනැති පෙත්සම;

(iii) මාතලේ, තැන්න, පිටියේගෙදර, අංක 44/03 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. වීරකෝන් බණ්ඩා මහතාගෙන් ලැබුණු 2024.12.06 දිනැති පෙත්සම;

(iv) අල්වත්ත, කරගහලන්ද යන ලිපිනයෙහි පදිංචි ටී. ජී. හැම්ලට් මහතාගෙන් ලැබුණු 2024.12.04 දිනැති පෙත්සම; සහ

(v) මාතලේ, වාලවෙල, එරමුදුගොල්ල, අංක 125/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. ජී. ටී. බණ්ඩාර විජේරත්න මහතාගෙන් ලැබුණු 2024.12.16 දිනැති පෙත්සම

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(2) බණ්ඩාරවෙල, මහඋල්පොත, මහගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. එම්. විමලරත්න මහතාගෙන් ලැබුණු 2024.12.04 දිනැති පෙත්සම ගරු චමින්ද විජේසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කිරිදිවැල, මිල්ලතේ, කිරිවැලේවත්ත, අංක 116/එෆ් දරන ස්ථානයෙහි පදිංචි බී. ජී. ඩබ්ලිව්. ජයසිංහ මහතාගෙන් ලැබුණු 2024.12.02 දිනැති පෙත්සම; සහ

(ii) සියඹලාපේ, මීගහවත්ත, රණසිංහ මාවත, අංක 90/5 දරන ස්ථානයෙහි පදිංචි ආර්. පී. කේ. ඒ. ඩබ්ලිව්. කේ. රණසිංහ මහතාගෙන් ලැබුණු 2024.12.04 දිනැති පෙත්සම

ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) වත්තේගම, මක්කානිගම, ඉහළගෝණාගම, අංක 19/4 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු 2024.11.30 දිනැති පෙත්සම; සහ

(ii) කටුගස්තොට, කහල්ල, පුරාණ විහාර පාර, අංක 20 බී 2 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. විරාජ් කුමාර සමරවීර මහතාගෙන් ලැබුණු 2024.11.28 දිනැති පෙත්සම

ගරු ඊ. එම්. බස්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(5) මීගහතැන්න, ගල්කැටිගහහේන යන ලිපිනයෙහි පදිංචි ජී. එල්. පියසේන මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම ගරු සංජීව රණසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 17 සඳුදා පූ.භා. 10.30 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම:** ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා ගරු බී. ආරියවංශ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂ ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිත කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 1/2024

(අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. සමුපකාර සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට නිසි ප්‍රසම්පාදන වැඩසටහනක් සකස් කිරීම:** ගරු කිංස් නෙල්සන් මහතා ගරු රෝහණ බංඩාර මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ග්‍රාමීය ජනතාවට ඉතාම සමීප ව්‍යාපාරයක් වූ සමුපකාර ව්‍යාපාරය මේ වනවිට විවිධ ගැටලුවලට මුහුණ දී තිබෙන හෙයින් සමුපකාර සමිති සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට රජය විසින් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2024

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම:** ගරු රෝහණ බංඩාර මහතා ගරු චතුර ගලප්පත්ති මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ ග්‍රහණයට නතුව තිබෙන හෙයින් වෙළඳපොළ තුළ සහල් මිල පාලනය කිරීම සඳහා රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාමට රජය විසින් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2024

"ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.01ට ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කම්කරු සුබසාධන නිලධාරීන් පත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම:** ගරු චමින්ද විජේසිරි මහතා ගරු හෙක්ටර් අප්පුහාමි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශාල දායකත්වයක් ලබා දෙන විදේශගත ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු සම්බන්ධව වගකීම් දරන කම්කරු සුබසාධන නිලධාරීන් පත් කිරීමේ දී මෙතෙක් නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් ගැටලු රාශියක් මතු වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2024

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අහෝසි කිරීම:** ගරු රවී කරුණානායක මහතා ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම නිල කාලය අවසන් වූ පසුව විශ්‍රාම වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින් විරුද්ධත්වයක් දක්වන බව ඉතා පැහැදිලිව පෙනෙන හෙයින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/2024

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කොවිඩ්-19 වසංගතයෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු මිහිදන් කිරීමෙන් වැළකී ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම:** ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු භූමදානය කිරීමේ හැකියාව පවතින බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් උපදෙස් නිකුත් කරනු ලැබ තිබියදී එම මළ සිරුරු භූමදානය කිරීමෙන් භූගත ජලයට වෛරසය මුසු වීමේ අවදානමක් පවතින බවට 2020 දී ආණ්ඩුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මත පදනම්ව එම මළ සිරුරු ඥාතීන්ගේ එකඟතාවයකින් තොරව ආදාහනය කළ හෙයින් ද, පසුව, එසේ ගනු ලැබූ තීරණය මත ක්‍රියාත්මකවීම නිවැරදි නොවූ බව සඳහන් කරමින් රජය විසින් නිල වශයෙන් සමාව අයැදීම සිදු කළ හෙයින් ද, මෙම වසංගතයෙන් මිය ගිය තැනැත්තන්ගේ ඥාතීන්ට සිය ආගමානුකූලව අවසන් කටයුතු සිදු කිරීමට හෝ එම සිරුරු දැක බලා ගැනීමට හෝ අවස්ථාව අහිමි වූ හෙයින් ද, මේ සම්බන්ධයෙන් දේශීය හා අන්තර්ජාතික මට්ටමින් ගොඩනැගුණු විරෝධතා සහ බලපෑම් හේතුවෙන් ආදාහනය කිරීම වෙනුවට මඩකලපුවේ ඔඩ්ඩමාවඩි, මජ්මා නගර් නම් හුදෙකලා ප්‍රදේශයේ එම සිරුරු භූමදානය කළ හෙයින් මිය ගිය තැනැත්තන් වෙනුවෙන් ඉටු කළ යුතුව තිබූ ආගමානුකූල චාරිත්‍ර සහ අවසන් ගෞරව දැක්වීමේ අයිතිය ඥාතීන්ට අහිමි වූ හෙයින් ද, මිය ගිය තැනැත්තන්ගේ පවුලේ සාමාජිකයන් හා සමීපතම ඥාතීන්ට සාධාරණය ඉෂ්ට කිරීමේ අවශ්‍යතාවය සහ මහජන ඉල්ලීම් සැලකිල්ලට ගෙන රජයේ පාර්ශ්වයෙන් සිදු වූ ඉහත සඳහන් බරපතල වැරදි විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/2024

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම (ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීමට, වංචා සහ දූෂණ නැති කිරීමට නිසි වැඩ පිළිවෙලක්):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 5.30 පසුකර තිබූයෙන්, අ.භා. 6.32ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව අද දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 17 සඳුදා පූ.භා. 10.30 වනතෙක් කල් තබන ලදී.